**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය - 2022**

------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 49 ඡේදය ප්‍රකාරව, වත්කම් පන්තියකට අයත් සියළු වත්කම් එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව අධිකාරිය සතු පරිගණක හා පරිගණක උපකරණ අතරින් 2017 වර්ෂයට පෙර මිලදී ගෙන තිබුණු ශුද්ධ අගය රු.257,180 ක් වූ පරිගණක සහ පරිගණක උපකරණ පමණක් 2022 පෙබරවාරි 28 දින රු.743,750 කට ප්‍රත්‍යාගණනය කර පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.486,570 ක ප්‍රත්‍යාගණන ලාභයක් හඳුනාගෙන තිබුණු අතර එම ප්‍රත්‍යාගණන අගය මත පදනම්ව පෙර වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂිකව රු.148,750 බැගින් ක්ෂය ගණනය කර ගිණුම්ගත කර තිබුණි. තවද වෘත්තීය සුදුසුකම් ඇති තක්සේරු වෘත්තියේ සාමාජිකයෙකු නොමැති කමිටුවක් විසින් ප්‍රත්‍යාගණනය කර තිබුණු බැවින් ප්‍රත්‍යාගණන අගයන්ගේ නිවැරදිතාවය පිළිබඳව මෙන්ම ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව්කර නොතිබුණු බැවින් ප්‍රත්‍යාගණන අගයන් පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කර ගැනීමේ නිවැරදිතාවය පිළිබඳව සහ ප්‍රත්‍යාගණන අගය මත පදනම්ව පෙර වර්ෂයට සහ සමාලෝචිත වර්ෂයට අදාළව සිදුකර තිබුණු රු.297,500 ක ක්ෂය ගැලපීමේ නිවැරදිතාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. | අධිකාරිය විසින් පරිගණක සහ පරිගණක උපකරණ අතුරෙන් 2017 ට පෙර මිලදී ගත් උපකරණ ප්‍රත්‍යාගණනය කරන ලද බව, කමිටුව විසින් සිදු කරන ලද ප්‍රත්‍යාගණනය මත පදනම්ව අධිකාරිය විසින් පෙර වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගැලපීම සිදු කරන ලද බව, මෙම ප්‍රත්‍යාගණන අගයන් 2021 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක බව, එදින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ගැලපීම් සිදු කර තිබුණු බව, ඒ පිළිබඳව 2021 මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදු නොකර තිබුණු බව, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි විධිවිධාන ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 ඡේදය | 2022 දෙසැම්බර් 31 දිනට රු.32,524,756 ක් වූ දේපල පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය හා ප්‍රත්‍යාගණන අගයන් ඇතුළත් කළ හැකි වන පරිදි විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර ඒ වෙනුවට වත්කම් අයිතම ප්‍රමාණය දැක්වෙන පරිදි ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනය පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනගතකර, ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) | 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP /SB/07/15 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | විදේශාධාර/ණය මෙරටට පිරිනැමීම සිදුකරනු ලබන්නේ රටේ සංවර්ධනයට මිස අධික පිරිවැයක් සහිත වැඩසටහන් සඳහා යෙදවීමට නොවන බවත්, අත්‍යාවශ්‍ය ස්වකීය වැඩසටහන් අවම පිරිවැයක් යටතේ සංවිධානය කළ යුතු බවත් සහ රජය විසින් පහසුකම් සපයා ඇති ආයතන ඒ සඳහා යොදාගත යුතු බවත් චක්‍රලේඛයේ දක්වා තිබුණු නමුත් ඊට පටහැනිව වැඩසටහන් 02ක් සහ රැස්වීම් 02ක් පිරිවැය අධික පෞද්ගලික හෝටල් වල පවත්වා තිබුණු අතර ඒ වෙනුවෙන් රු. 1,057,385 ක මුදලක් අධිකාරිය විසින් වැය කර තිබුණි. | මෙම වැඩසටහන් සහ රැස්වීම් සඳහා උසස් මට්ටමේ නිලධාරීන් සහභාගී වූ බව, චක්‍රලේඛයේ සඳහන් ආයතන වලින් මිල ගණන් කැඳවා ඇති බව, අඩුම මිල ගණන් ලබාදී ඇති ආයතනයේ වැඩසටහන පවත්වන ලද බව, ඇතැම් වැඩ සටහන් උත්සවාකාරයෙන් පැවත්වූ බව, එහිදී ශාලා පහසුකම් සඳහා ඒක පුද්ගල වැයවී ඇත්තේ රු.3,750 ක් බව, එය චක්‍රලේඛයේ සඳහන් ආයතන වල මිලගණන් හා සසඳන විට අඩු අගයක් බව. | වැඩසටහන් සහ රැස්වීම් සංවිධානය කිරිමේදී චක්‍රලේඛය ප්‍රකාරව වියදම් කළමනාකරණය කළ යුතුය. |
| (ඇ) | 2021 අප්‍රේල් 09 දිනැති අංක සීජීඅයිආර්/2021/ 02-02 දරන දේශිය ආදායම් දෙපාර්තමේන්තු ලිපිය | රාජ්‍ය ආයතන හා රජයට අයත් ආයතන විසින් සැපයුම්කරුවන් වෙත ගෙවන ලද එකතුකල අගය මත බදු පිළිබඳ තොරතුරු නියමිත ආකෘති පත්‍ර ප්‍රකාරව සෑම කාර්තුවක්ම අවසන් වී ඊළඟ මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදයම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත් එපරිදි අධිකාරිය | සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතු කල අගය මත බදු පිලිබඳව තොරතුරු නියමිත ආකෘති පත්‍රය ප්‍රකාරව සෑම කාර්තුවක් අවසානයේම ඊලග මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යැවීමට සටහන් කර ගන්නා බව, 2022 වර්ෂයේ ගෙවන ලද එකතු කළ අගය මත | දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ විධිවිධාන ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | විසින් සමාලෝචිත වර්ෂය පුරාවටම ක්‍රියාකර නොතිබුණි. | බදු ඇතුලත්ව සැපයුම්කරුවන්ගේ තොරතුරු වහාම දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යැවීමටද කටයුතු කරන බව. | |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය | මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන දින 22 ක් ප්‍රමාදවී විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | අධිකාරිය සඳහා 2023 වර්ෂයේ නව අධ්‍යක්ෂක මණ්ඩලය පත් කර අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම 2023 මාර්තු 22 දින දක්වා පැවැත්වීමට නොහැකි වීම නිසා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූ බව. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාදයකින් තොරව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,043,684 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,523,419 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,567,103 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ පුනරාවර්තන ප්‍රදාන සහ විදේශීය ප්‍රදාන පිළිවෙලින් සියයට 33 කින් සහ සියයට 74 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1.1 අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවීම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ වාර්තා අනුව වර්තමානයේ දුම්කොළ නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකාවේ පවතින බදුකරණ ව්‍යුහය අවිධිමත් සහ සංකීර්ණ බවත්, එය බදු වර්ග කිහිපයක එකතුවකින් සමන්විතවන බවත්, 2016 වර්ෂයේ සිගරට් මත වූ සුරාබදු ආදායම රජයේ සමස්ථ ආදායමෙන් සියයට 7.3ක් වුවත් එය 2020 වර්ෂය වන විට සියයට 3.1 දක්වා පහත වැටී තිබුණු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අධිකාරිය විසින් 2020 සහ 2021 යන වර්ෂවලදි ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූල්‍ය ප්‍රදාන සහ දේශිය අරමුදල් ලෙස රු. 994,148ක වියදමක් දරා දුම්කොළ සඳහා නව බදුකරණ සූත්‍රයක් හදුන්වාදී තිබුණු අතර මෙම නව බදුකරණ සූත්‍රය යොදා ගැනීමෙන් | ජනාධිපතිවරයා වෙත 2021 දෙසැම්බර් 27 වන දින ලිපියක් මඟින් මෙම බදුකරණ සූත්‍රය ක්‍රියාවට නොනැන්වීම පිළිබඳව දැනුවත් කර ඇත. මෙම නව බදුකරණ සූත්‍රය නීතියක් බවට පත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු නැවත ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. නැවතත් විධිමත්ව මෙම බදුකරණ සූත්‍රය ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | දුම්කොළ සඳහා නව බදුකරණ සූත්‍රය නීතියක් බවට පත්කර ගැනීම කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2021 වර්ෂයේ රු. බිලියන 91.6 ක්ව පවතින සිගරට් මත වූ සුරාබදු ආදායම 2026 වර්ෂයවන විට රු. බිලියන 124.6 ක් දක්වා වැඩිකර ගත හැකි බවටත්, එය දුම්කොළ පරිභෝජනය සියයට 1.1 කින් පහත වැටීමකට සහ වාර්ෂිකව රාජ්‍ය ආදායම සියයට 6 කින් පමණ වැඩිවීමකට හේතුවන බවටත් අපේක්ෂාකර තිබුණි. කෙසේ නමුත් දුම්කොළ සඳහා නව බදුකරණ සූත්‍රය මෙම වාර්තාවේ දිනය වන විටත් නීතියක් බවට පත්වී නොතිබුණි. | | |
| (ආ) | 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 35(2)(ඇ) වගන්තිය ප්‍රකාරව දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවිකිරීම සඳහා තබා ඇති ස්ථානයක් තුළ දුම්කොළ නිෂ්පාදන හා මධ්‍යසාර නිෂ්පාදන ඒ ස්ථානයේ අලෙවි කිරීම සඳහා තිබෙන බව නියමකොට හඳුන්වා දෙමින් සහ ඒවායේ මිල ගණන් දක්වමින් නියමිත ප්‍රමාණයේ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දී තිබුණද, උක්ත වගන්තියට අදාළවන පරිදි නියෝග සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ අනුව පනත යටතේ වූ බලයලත් නිලධාරින්ට දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීම සඳහා තබා ඇති ස්ථානවල ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම් නියාමනය කිරීමට නොහැකිවී තිබෙන බව නිරීක්ෂණය විය. | පාරිභෝගික අධිකාරිය පනත ප්‍රකාරව මිල හා වර්ගය පමණක් දක්වන ලෙසට නියාමනය කර 2022 මැයි 29 දින ලේකම් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පිටපත් සහිතව අමාත්‍යවරයා වෙත ආමන්ත්‍රනය කර ඇති බව, එම ලිපි සඳහා ප්‍රතිචාර නොමැති බැවින් 2022 දෙසැම්බර් 27 සිහිකැඳවීමට ලිපියක් ද සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති බව, රූපමය අවවාද වර්ග කලයුතු බවට 2015 අංක 03 දරණ පනතින් සංශෝධිත 2006 අංක 27 දරණ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනතේ දක්වා නොමැති බව, එහි රූපමය සෞඛ්‍ය අවවාද නිර්දේශ කිරීම හා ඊට අදාළව සීඩී තැටියක් නිකුත් කිරීම අධිකාරිය සතු කාර්යක් බව. | දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීම සඳහා තබා ඇති ස්ථානවල ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම් නියාමනය කඩිනමින් ඉටුකළ යුතුය. |
| (ඇ) | 2012 අගෝස්තු 08 දිනැති අංක 1770/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ 10 ඡේදය ප්‍රකාරව සහ 2015 අංක 3 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත මගින් සංශෝධිත 2006 අංක 27 දරන | එම | සෞඛ්‍ය අවවාද වෙනස් කිරීමෙහි සඵලදායකත්වය උපරිම කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 අ(5) වගන්තිය ප්‍රකාරව සිගරට් සහ දුම්කොළ නිෂ්පාදකයින්ට සෞඛ්‍ය අවවාද මාස හයකට වරක් වෙනස් කර සිගරට් පැකට්, ඇසුරුම් හෝ කාඩ්බෝඩ් පෙට්ටි මත ප්‍රදර්ශනය කිරීමට හැකිවන පරිදි ඉහත ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශිත සෞඛ්‍ය අවවාද 08 ක සංචිතය පුළුල් කිරීම සඳහා 2022 වර්ෂයේදි සෞඛ්‍ය අවවාද 10 ක් හඳුනාගෙන තිබුණු නමුත් ඒවා වර්ගකිරීමක් කර නොතිබුණි. එසේම මෙම වාර්තාවේ දිනය දක්වාම එම නව සෞඛ්‍ය අවවාද රජයේ ගැසට්පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. එම නිසා 2015 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දිනය දක්වා වූ වසර 08 ක පමණ කාලපරිච්ඡේදය තුළ සෞඛ්‍ය අවවාද 08 ක සංචිතය පමණක් භාවිතා වීමෙන් සෞඛ්‍ය අවවාද වෙනස් කිරීමෙහි සඵලදායකත්වය උපරිම කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | | |

### 3.2 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ සාමාන්‍යාධිකාරි තනතුර සඳහා 2021 වර්ෂයේ මැයි මස බඳවා ගෙන තිබුණු අයදුම්කරු (නිලධාරිනිය) විසින් අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටියේ 4.1 ඡේදය යටතේ වූ අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබියදී සාමාන්‍යාධිකාරි තනතුරට පත්කර 2022 ජුනි දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු. 1,991,574 ක වියදමක් දරා තිබුණ ද සාමාන්‍යාධිකාරි තනතුරට අදාළ විෂය පථයේ රාජකාරි ඉටුකිරීමේදි ඉහත නිලධාරිනියගේ අකාර්යක්ෂමතාවය නිසා ඇයගේ සේවය 2022 ජූලි මස අවසන් කර තිබුණි. මෙලෙස අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව අවශ්‍යවන අවම සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවකු සාමාන්‍යාධිකාරි තනතුරට පත්කර තිබීමෙන් එම තනතුර | කළමනාකරණ මට්ටම යන්න සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැහැදිලි කර ගනු ලැබුවේ ඇය මීට පෙර සේවය කල ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ ලැබූ වැටුප් පරිමාණය පිළිබඳ සැලකිල්ලට ගැනිමෙන් බව, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඇය විසින් ඉදිරිපත් කල ලිපියකින් 1993 වසරේ සිට ඇය පර්යේෂණ සහකාර තනතුර එම ආයතනයේ දරා ඇති බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට තහවුරු වූ අතර නාරා ආයතනයේ සේවා කාලය වසර 28 න් වසර 13 සඳහා “ අදාළ අතිරේක පළපුරුද්ද “ සඳහා වූ සම්පූර්ණ ලකුණු ප්‍රමාණය මෙහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඇය වෙත ලබා දෙන ලද බව, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය | අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව අවශ්‍යවන සුදුසුකම් සපුරා තිබෙන අයදුම්කරුවන් පමණක් බඳවා ගත යුතු අතර මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| සඳහා අපේක්ෂා කළ පරිදි කාර්යසාධනයක් ලබා කර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබීම හේතුවෙන් දරන ලද රු. 1,991,574ක වියදම අනාර්ථික ගණුදෙනුවක් බවට නිරීක්ෂණය විය. | විසින් ඇයව එම තනතුරට තෝරාගන්නා බවට නිර්දේශ කර සටහනක් ලකුණු සටහන් පත්‍රෙය් නොතැබීම ප්‍රමාද දෝෂයක් බව. | |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් 2021 හා 2022 යන වර්ෂයන්හිදී රු.1,307,282 ක වියදමක් දරා අවස්ථා තුනකදී සහතිකපත්‍ර මනෝ උපදේශන පාඨමාලා පවත්වා පුද්ගලයින් 108 දෙනෙකු සඳහා සහතික පත්‍ර නිකුත්කර තිබුණු අතර ඉන් නිලධාරීන් 83 ක් ස්වේච්ඡා පදනම මත වැටුප් හෝ දීමනා ගෙවීමකින් තොරව කාර්යාල වේලාවෙන් පසුව ඉහත මනෝ උපදේශන සේවාවේ යෙදීමට අවස්ථාව ලබා දී තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුළ උපදේශනය කර තිබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව 3,666 ක් වූ අතර ඉන් ඇමතුම් 2,085ක් ස්වේච්ඡා මනෝ උපදේශන සේවා නිලධාරීන් විසින් උපදේශනය කර තිබුණි. කෙසේ නමුත් දින 143 කදී සිදුකරන ලද මනෝ උපදේශන සංඛ්‍යාව පිළිබඳව එම ස්වේච්ඡා නිලධාරීන් විසින් අධිකාරියට වාර්තා කර නොතිබුණි. එසේම ස්වේච්ඡා නිලධාරීන් විසින් උපදේශනය කරන ලද ඇමතුම් සංඛ්‍යාව පමණක් වාර්තාකරන අතර ඔවුන් විසින් සපයා තිබුණු උපදේශන සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳව ඇගයීමක් අධිකාරිය විසින් සිදුකර තිබුණු බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. ඒ අනුව ස්වේච්ඡා මනෝ උපදේශන සේවා නිලධාරීන් විසින් සිදුකර තිබුණු උපදේශනය සම්බන්ධයෙන් වූ අධිකාරියේ | අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය පරිදි ස්වෙච්චා පදනම මත මනෝ උපදේශණය ලබා දෙන නිලධාරීන්ගේ වැඩමුර ලැයිස්තුව සභාපතිතුමන්ගේ අවසරය මත පද්ධතියට ඇතුළු කරන බව, මෙම නිලධාරීන් මනෝ උපදේශණ සේවාව ලබා දීමේදී ගැටළුකාරී හෝ අපහසු අවස්ථාවක් වෙතොත් අප හට දැනුම් දෙන බව, ස්වෙච්චාවෙන් මනෝ උපදේශණය ලබා දෙන නිලධාරීන්ගේ මනෝ උපදේශණය ලබාදීම සම්බන්ධයෙන් සමාලෝචන රැස්වීමක්ද 2022 නොවැම්බර් 05 වන දින පවත්වා අත්දැකීම් හා මනෝ උපදේශණය ලබා දීම සම්බන්ධයෙන් තවදුරටත් සාකච්චා කරන ලද බව, 1948 මනෝ උපදේශණ සේවාවේ ගුණාත්මක භාවය වැඩිකිරීම සඳහා උපදේශණ සේවාවේ තත්වය විශ්ලේෂණය කර ස්වෙච්චා සේවකයින්ගෙන් ලබා ගනුලබන සේවය විධිමත් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ලෝක සෞඛ්‍ය සංවිධානයේ හෝ රාජ්‍ය ප්‍රතිපාදන මඟින් සිදු කිරීම සඳහා අදාළ කටයුතු සිදු කරනු ලබන බව. | ස්වේච්ඡා මනෝ උපදේශන සේවා නිලධාරීන් විසින් සිදුකරන උපදේශනය සම්බන්ධයෙන් වූ අධිකාරියේ අධීක්ෂණය ශක්තිමත් කිරීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණි. | | |
| (ආ) 2019 අප්‍රේල් 22 දිනැති අංක 09/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව 2019 ජූලි මාසයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා අධිකාරියේ නිලධාරීන් 13 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු.690,648 ක අන්තර් දීමනාව සහ 2021 ජූනි 15 දිනැති අංක 21/Misc (032) දරන අමාත්‍ය මණ්ඩල තීරණයට සහ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 ජූනි 16 දිනැති අංක MIN/add/See/Admin/16/21 දරන ලිපියට පටහැනිව 2021 ජූනි මාසයේ සිට 2021 අගෝස්තු මාසය දක්වා අධිකාරියේ කාර්ය මණ්ඩලයේ 12 දෙනෙකු වෙත ගෙවන ලද රු.262,375 ක විශේෂ දීමනාව මෙම වාර්තාවේ දිනය වන විටත් අදාළ නිලධාරින්ගෙන් හෝ ඊට වගකිවයුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර නොතිබුණි. | ගෙවන ලද විශේෂ දීමනාව සඳහා සෞඛ්‍ය ලේකම්ගේ ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව, 2019 අප්‍රේල් 22 දිනැති අංක 9/2019 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ගෙවන ලද දීමනාව සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | ගෙවන ලද අන්තර් දීමනාව සහ විශේෂ දීමනාව දීමනා ලාභීන්ගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අධිකාරිය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අධිකාරිය වෙනුවෙන් අභ්‍යන්තර විගණක තනතුර අනුමත වී නොමැති බව, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කල යුතු බව, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය අංශයේ කාර්යය මණ්ඩලය හිගතාවය හේතුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැති බව. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය. |